ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමකට බොහෝ විට වෙනත් දිවි තොර කරගැනීමේ සිදුවීමකට වඩා ඉහළ අවධානයක් ලැබිය හැක. එනිසා, එවැනි අනුකාරක සිදුවීම් වැළැක්වීම් සඳහා, මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගත වීමත්, ඒ සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීමත් අත්‍යවශ්‍ය වේ.

අප්‍රේල් 24, 2022 දින සිදු වූ වැබඩ ඝාතන-දිවි තොර කරගැනීමට තැත් කිරීම් සිදුවීමක් මාධ්‍ය වාර්තා කළ අයුරු, මෙවැනි සිදුවීම් වාර්තාකරණයේදී මාධ්‍ය මාර්ගෝපදේශයන් උල්ලංඝනය වන ආකාරය සඳහා උදාහරණ වේ.

1) දිවි අහිමි කර ගැනීමට තැත් කළ ආකාරය දීර්ඝ ලෙස විස්තර කර ඇත.
2) දිවි අහිමි කර ගැනීමේ පුවත ප්‍රමුඛතාවයෙන් පළ කර ඇත
3) දිවි අහිමි කර ගැනීමට තැත් කළ ස්ථානය ඡායාරූප සහිතව පළ කර ඇත.
4) මියගිය කාන්තාවගේ ඡායාරූප පළ කර ඇත.
4) උපකාරක අංක සඳහන් කර නොමැත.

මෙවැනි වාර්තාකරණයන් ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට මග පෑදීමේ හැකියාවක් නොමැති ද?
එසේම, මෙවැනි පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක සඳහන් වූයේ නම්, එය තවත් ජීවිතයක් බේරාගැනීමට පිටුවහලක් නොවන්නේ ද?

ඒ හැරෙන්න, මිය ගිය කාන්තාවගේ ඡායාරූප පළ කිරීම ඔස්සේ, ඇගේ පවුලේ අයවලුන්ට සිත් වේදනාවන් ඇති වීමක් සිදු නොවන්නේ ද?

ඔබේ අදහස?

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...
https://media.samaritans.org/.../Samaritans_Ireland_media...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...